Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## මිනුවන්ගොඩ නගර සභාව

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට විවෘත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### උපලේඛනය

<table>
<tr><th>අනු. අංකය</th><th>තනතුරු නාමය</th><th>තනතුරු සංඛ්‍යාව</th><th>වැටුප් කේත අංකය</th><th>වැටුප් පරිමාණය</th><th>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</th></tr>
<tr><td>01</td><td>වෙළඳසැල් පරිපාලක III ශ්‍රේණිය</td><td>01</td><td>MN1/2016 (රා.ප.ච.03/2016 ට අනුව)</td><td>රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540<br>(බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.)</td><td>
බඳවා ගැනීමේ ක්‍රමය :<br>
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>
සහ<br>
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් වත් (01) (සාමාන්‍ය පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>
වෘත්තීය සුදුසුකම් : අදාළ නැත<br>
පළපුරුද්ද - අදාළ නැත<br>
කායික සුදුසුකම් :<br>
තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>
ලිඛිත විභාගය :
<table>
<tr><th>විෂයයන්</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
</table>
සටහන : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙළ අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩුව පුරවනු ලැබේ.<br>
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :<br>
මෙහි දී ලකුණු ලබාදෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.
</td></tr>
</table>

*2. පොදු සුදුසුකම් :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(2) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(3) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(4) අවම වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
(5) උපරිම වයස් සීමාව - අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(6) තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

4. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2021.04.01 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මිනුවන්ගොඩ නගර සභාව, මිනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා නොබලන අතර ඒ බව ලිඛිතව දනුම් දෙනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. ග්‍රාම නිලධාරි සහතිකය.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේ දී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියළු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතුවේ.

පී. ඒ. එස්. එස්. සඳරුවන්,
ලේකම්,
මිනුවන්ගොඩ නගර සභාව,
මිනුවන්ගොඩ.

2021 පෙබරවාරි මස 24 වැනි දින,
නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ ............................................ තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :........................................
2. සම්පූර්ණ නම :........................................
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :........................................
4. ස්ථිර ලිපිනය :........................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :........................................
6. ස්ත්‍රී/පුරුෂභාවය :........................................
7. උපන් දිනය : අවුරුද්ද :................. මාසය :............... දිනය :...............
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :........................................
9. විවාහක/අවිවාහක බව :........................................
10. දුරකථන අංකය :........................................
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත ඇමිණිය යුතුය.)

12. වෙනත් සුදුසුකම් :.........................................

13. සේවා පළපුරුද්ද :.........................................

14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

.

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.................................

**අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ............................................................................ මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා පත්වුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව හා *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සතුටුදයක සේවා කාලයක සපුරා ඇති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

...........................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :.......................................................................

තනතුර :.....................................................................

දිනය :.......................................................................